# ශ්‍රී ලංකාවේ මෝටර් රථ වාහන භාවිතය පිළිබඳ කාර්මික පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

FACULTY OF GRADUATE STUDIES
21 JAN 2015
UNIVERSITY OF KELANIYA

932

එම්.ඩබ්ලිව්.ඒ.ඩී.එන්. විජේසූරිය

**FGS/03/02/01/2008/01**

දර්ශනපති උපාධිය

කැලණිය විශ්වවිද්‍යාලය

2014 මැයි

# සාරාංශය

මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාවේ මෝර් රථ භාවිතයේඉතිහාසයපිළිබඳඅධ්‍යයනයක් 50 දශකයේදීනූතන තාක්ෂණික ප්‍රවර්ධනයේ මුල්කාලීන අවශේෂ හදාරන විෂයය කොටසක් ලෙස පුරාවිද්‍යාවට එකතු වූ කාර්මික පුරාවිද්‍යාත්මක පදනමකින් සිදුකර ඇත. එම පසුබිමට අනුව 19 වන සියවසේ අගභාගයේ දී ලංකාවේ ස්ථාපිතව තිබූ සාම්ප්‍රදායික ගැමි ආකෘතියට සකසවී තිබුණු සමාජයට මොටර් රථය නැමැති නූතන කාර්මික ඒකකය සම්ප්‍රාප්ත ව ශ්‍රී ලංකා සමාජයේ විවිධ පන්ති ස්ථරායනයන්, කුල, ජාතීන් හා විවිධ ව්‍යක්තීන් හරහා ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්තව ක්‍රමයෙන් ස්ථාපිත වූ ආකාරයේ රටාව හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණවේ. එම අරමුණට සමගාමීව දිවයිනපුරා ගවේෂණ කරනු ලැබූ මෝටර් රථ 323 ක් වසර හතක් තුළ කරනු ලැබූ සමීක්ෂණ මගින් එක් රැස්කර ලබාගත් පර්යේෂණ ප්‍රතිඵලවලට අදාළව මෙරට පන්ති ස්ථරයන් අතර සිටි ඉහළ ම ස්ථරයවන රදළ වලව් සමාජය හම්බර්, බෙන්ස්, රෝල්ස්රොයිස් වැනි වර්ගත් ධනේශ්වර සමාජය ජගුවර්, සන්බීම්, හැඩසන් වැනි ප්‍රමාණයෙන් විශාල මෝටර් රථවලටත් සාමාන්‍ය පන්තිය ෆෝඩ්, ෆියට්, මයිනර්, මොරිස්මයිනර් වර්ගවලටත් නැඹුරුව ඇති අතර ව්‍යාප්තියේදී මෝටර් රථ මිලදී අතර පැහැදිලි වෙනස්කම් පවතින බව අනාවරණය විය. කුල ස්ථරායනයන් අතර මෝටර් භාවිතයේ වැඩිම ව්‍යාප්තියක් සටහන් කරනුයේ කරාව කුලයයි. ප්‍රාදේශීය වශයෙන් මෝටර් රථය පැතිරීමේ දී ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකට ම මෝටර් රථය පැතිරී ඇති අතර වැඩිම මෝටර් රථ ප්‍රමාණයක් ව්‍යාප්තව ඇත්තේ කොළඹ ප්‍රදේශයේ ය .මෙම පර්යේෂණ ප්‍රතිඵල විමර්ශණාත්මකව හා සවිස්තරාත්මකව මෙම පර්යේෂණයේ අන්තර්ගත කර ඇත.